කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E2054 - සාර්ව ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව : 06 කාලය : පැය 03 යි

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

01. අ. අංශ හතරකින් යුත් කල්පිත ආර්ථිකයක පහත තොරතුරු ඔබට ලබා දී ඇත. සියළුම සංඛ්‍යා රුපියල් මිලියනවලිනි.

| | | |
|---|---|---|
| C | $= 150 + 0.75\ Yd$ | පරිභෝජන ශ්‍රිතය |
| I | $= 100$ | ආයෝජන වියදම් |
| Tx | $= 20 + 0.20\ Y$ | බදු ශ්‍රිතය |
| G | $= 115$ | රාජ්‍ය වියදම් |
| Tr | $= 40$ | සංක්‍රාම වියදම් |
| X | $= 35$ | අපනයන |
| M | $= 15 + 0.1Y$ | ආනයන |
| Yd | = වැයකළ හැකි ආදායම | |

පහත දෑ සොයන්න.

- i. ජාතික ආදායම් සමතුලිත මට්ටම
- ii. සමතුලිත ආදායමේදී පරිභෝජනය
- iii. සමතුලිත ආදායමේදී ශුද්ධ අපනයන (X - M)
- iv. ආයෝජන රු. මිලියන 50 කින් ඉහළ ගියහොත්, ජාතික ආදායම කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේද ?
- v. මෙම ආර්ථිකයෙහි පූර්ණ සේවා නියුක්ති මට්ටම රුපියල් මිලියන 1,200 ළඟා කරගැනීමට, රාජ්‍ය වියදම් ඉහළ නැංවිය යුතු ප්‍රමාණය.

(ලකුණු 22)

ආ. පහත සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

- i. වියදම් ගුණකය
- ii. බදු ගුණකය
- iii. සංක්‍රාම ගුණකය
- iv. මුදල් ගුණකය

(ලකුණු 02 බැගින් = ලකුණු 08)

ඇ. 1S - LM ආකෘතිය යටතේ භාණ්ඩ වෙළඳපොළ සමතුලිත වන්නේ කෙසේද යන්න රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 03)

ඉ. 1S - LM ආකෘතිය අනුව, මුදල් වෙළඳපොළ සමතුලිතයට බලපාන සාධක මොනවාද ?

(ලකුණු 03)

ඊ. සමාහාර ඉල්ලුම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ? රූපසටහනක් ආකාරයෙන් සමාහාර ඉල්ලුම් වක්‍රය ගොඩනගන්න.

(ලකුණු 04)

(මුළු ලකුණු 40)

02. ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ගැටළු වල වැදගත්කම අවධාරණය කරමින්, රටක සාර්ව ආර්ථික විචල්‍යයන්හි වැදගත්කම සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 15)

03. අ. අංශ හතරකින් යුතු ආර්ථිකයක ආදායම් වියදම් චක්‍රාකාර ප්‍රවාහය රූපසටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. අවසාන නිෂ්පාදිත සහ අතරමැදි නිෂ්පාදිත අතර වෙනස පහදන්න. මේවා ජාතික ආදායම ගණනයේදී බලපාන්නේ කෙසේද ?

(ලකුණු 05)

(මුළු ලකුණු 15)

04. " අයවැය සහ මූල්‍ය ප්‍රතිපත්ති, ආර්ථිකයක් වඩා සුමටව ක්‍රියාත්මක කරවීම සඳහා යොදා ගත හැකි හොඳම ආර්ථික ප්‍රතිපත්තීන් දෙක වේ." අවශ්‍ය තැන්හිදී රූප සටහන් භාවිතයෙන්, අයවැය සහ මූල්‍ය ප්‍රතිපත්තිවල කාර්යක්ෂමතාවය පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 15)

05. උද්ධමනය, ශ්‍රී ලංකාවේ විවිධ සමාජ ස්ථර, ආර්ථික වෘද්ධිය සහ සේවා නියුක්තියට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(මුළු ලකුණු 15)

06. කෙටි සටහන් ලියන්න.

අ. ආන්තික පරිභෝජන නැමියාව

ආ. කාර්තුමය සේවා වියුක්තිය

ඇ. සමාහාර ඉල්ලුම සහ සමාහාර සැපයුම

(ලකුණු 05 බැගින් = මුළු ලකුණු 15)